සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

සැ.යු. :-

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 40 ක් හිමි වේ.
- අංක 1 සිට 40 තෙක් ඇති (1), (2). (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. තොරතුරු මූලාශ්‍රය හා අග්‍රස්ථානය යන සන්නිවේදන මූලිකාංග දෙක ඇතුළත් කරමින් සිය සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කළේ,
    (1) හැරල්ඩ් ඩී ලැස්වෙල් ය. (2) එඩ්වඩ් හාපර් ය.
    (3) අයිරා රබෙල් ය. (4) ෂැනෝන් හා වීවර් ය.

02. ලොව ප්‍රථම කඩදාසිය නිර්මාණය කළේ,
    (1) ප්‍රංශය යි. (2) ජර්මනිය යි. (3) චීනය යි. (4) ඇමරිකාව යි.

03. මාධ්‍ය ආයතනයක සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන්නේ ජනමාධ්‍ය ආයතනයේ,
    (1) ප්‍රධාන විධායක නිලධාරියාට යි. (2) ප්‍රධාන කර්තෘට යි.
    (3) මාධ්‍යවේදීන්ට යි. (4) සංස්කාරක කර්තෘට යි.

04. අනාවරණ ක්‍රියාවලියේ දී ආලෝකය පාලනය කරන කැමරාවේ කොටස් දෙක වන්නේ,
    (1) කැමරා කාචය හා ද්වාරයයි. (2) කාච විවරය හා ද්වාරයයි.
    (3) කාච විවරය හා පටල පටියයි. (4) කැමරා කාචය හා පටල පටියයි.

05. පරිගණකය භාවිතයට පෙර එම කාර්ය කර ඇත්තේ,
    (1) රෝනියෝ යන්ත්‍රය යි. (2) යතුරු ලියනය යි.
    (3) ඩොට් මුද්‍රණ යන්ත්‍රය යි. (4) පේජරය යි.

06. පුරවැසියෙකුගේ ලක්ෂණයක් වීමට අවම ඉඩක් ඇත්තේ,
    (1) සමාජ සුභසාධනයට කටයුතු කිරීමයි. (2) පවුල තුළ යහපත් ව ජීවත් වීමයි.
    (3) ඕනෑම වෘත්තියක නිරත වීමයි. (4) ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වීමයි.

07. රුවනි තමා රචනා කළ ග්‍රන්ථයෙහි සෝදුපත් බැලීමට රුවන්තිකාට දුන්නාය. සෝදුපත් කියවීම යනු
    (1) අවසාන පිටපත කියවීමයි. (2) එකවර දෙදෙනෙකු විසින් පිටපත කියවීමයි.
    (3) මුද්‍රිත දෙවන පිටපත කියවීමයි. (4) අත් පිටපත හා මුද්‍රිත පිටපත සංසන්දනය කර කියවීමයි.

08. වාර්තා වැඩසටහනක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති පහත ප්‍රකාශය අතුරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    (1) සෞන්දර්යාත්මක බවකින් යුතු වෙයි.
    (2) තොරතුරුමය ගුණයකින් යුතු වෙයි.
    (3) විවිධත්වයෙන් යුතු තොරතුරු ගොනුවකින් යුතු වෙයි.
    (4) පසුබිම් කථනයක් හෝ නාට්‍යයක දෙබසක් ආකාරයෙන් ඉදිරිපත් කරයි.

09. දැන්වීම් ප්‍රචාරය කිරීමේ අරමුණින් 1950 වර්ෂයේ බිහි වූ ගුවන්විදුලි සේවය වන්නේ,
    (1) රජරට සේවයයි. (2) ලක්හඬ සේවයයි. (3) City FM සේවයයි. (4) වෙළඳ සේවයයි.

10. මිනිසෙකු විසින් බල්ලෙකු සපා කෑම ප්‍රවෘත්තියක් බව ප්‍රකාශ කළේ,
(1) චාල්ස් ඇන්ඩර්සන්ඩානා ය. (2) මිල්ටන් බ්‍රෂ් ය.
(3) පෝල් ඩී මැසෙනියර් ය. (4) ඇලොයිස් සෙනෙෆෙන්ඩර් ය.

11. ද්වි මාර්ගික සන්නිවේදන ක්‍රියාවලියක ඵලදායිතාවය රඳා පවතින්නේ පහත සඳහන් කවර සන්නිවේදන මූලිකාංගයක් මත ද?
(1) සන්නිවේදකයා (2) ග්‍රාහකයා (3) සංදේශය (4) ප්‍රතිපෝෂණය

12. විනිවිදක රූප රාමු භාවිත වන්නේ,
(1) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයේ ය. (2) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයේ ය.
(3) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයේ ය. (4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයේ ය.

13. රටෙහි පවතින ආර්ථික අර්බුදය හමුවේ ජනමාධ්‍යයක වගකීම වන්නේ,
(1) දේශීය නිෂ්පාදන හා වෙළඳ පළ ප්‍රවර්ධනයට වැඩසටහන් ඉදිරිපත් කිරීමයි.
(2) මූල්‍යමය වංචා, දූෂණ සිදු කළ නිලධාරීන් හඳුනා ගෙන දෝෂාරෝපණය කිරීමයි.
(3) වැඩ ලෝකය හා වෙළඳපළ තුළ ඇති අර්බුධ පිළිබඳ ජනතාව දැනුවත් කිරීමයි.
(4) රජය විසින් ජනතාවගෙන් බදු අය කර ගැනීම සාධාරණීකරණය කිරීමයි.

14. ඡායාරූපකරණයේ දී ISO අගය මගින් මැන බලන්නේ,
(1) පටල වේගය යි. (2) ක්ෂේත්‍ර ගැඹුර යි. (3) නාභීය දුර යි. (4) විභේදන බලය යි.

15. වර්ණ ඡායාරූප වැඩි ප්‍රමාණයක් ඇතුළත් වීම.
මෘදු හා සංවේදී පුවත් ඇතුළත් වීම.
අපරාධ තොරතුරු හා ත්‍රාසජනක තොරතුරු ඇතුළත් වීම.
ඉහත තොරතුරු දක්නට ලැබෙන්නේ,
(1) බ්‍රොඩ්ෂීට් පුවත්පත්වලයි. (2) ටැබ්ලොයිඩ් පුවත්පත්වලයි.
(3) බර්ලිනර් පුවත්පත්වලයි. (4) කොම්පැක්ට් පුවත්පත්වලයි.

16. ගුවන් විදුලිය මගින් ප්‍රචාරය කරන අවධාරිත නිවේදන වලට අයත් නොවන ප්‍රකාශය තෝරන්න.
(1) ඩෙංගු පිටු දකිමු ජීවිත බේරා ගනිමු.
(2) මුඛ ආවරණ පැළඳ නිරෝධායන නීති පිළිපදින්න.
(3) සුදෝ සුදු දත් පෙළක් සඳහා සුදිල දත් බෙහෙත් ඔබත් මිලදී ගන්න.
(4) උණුසුම් කාලගුණ තත්වය හමුවේ වැඩි වශයෙන් ජලය පානය කරන්න.

17. විද්‍යුත් මාධ්‍ය නාලිකා ආරම්භ කිරීමේ දී බලපත්‍ර හා සංඛ්‍යාත පද්ධති බෙදා දෙන්නේ,
(1) ජනමාධ්‍ය අමාත්‍යාංශය යි. (2) විදුලි සංදේශ නියාමන කොමිසම යි.
(3) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යි. (4) විද්‍යුත් මාධ්‍ය ආයතනය යි.

18. විදුහල්පතිතුමා සන්නිවේදන පද්ධතිය මගින් පන්ති කාමරවල සිටින ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ට උදෑසන රැස්වීම සඳහා ක්‍රීඩාංගනයට පැමිණෙන ලෙස දන්වා සිටියේය. මෙම අවස්ථාව අයත් වන සන්නිවේදන ස්වරූපය වන්නේ,
(1) සමූහ සන්නිවේදනයට යි. (2) ද්විමාර්ගික සන්නිවේදනයට යි.
(3) අවිධිමත් සන්නිවේදනයට යි. (4) විධිමත් සන්නිවේදනයට යි.

19. චමිල් පුවත්පත් මාධ්‍ය ආයතනයක ස්ථිර කාර්ය මණ්ඩලය තුළ මාසික වේතනයක් ලබමින් සේවය කරයි. ඔහු
(1) ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකි. (2) වෘත්තිය මාධ්‍යවේදියෙකි.
(3) පුරවැසි මාධ්‍යවේදියෙකි. (4) නිදහස් මාධ්‍යවේදියෙකි.

20. මිනිස්සු තමා අවට ප්‍රදේශවල, තම රටෙහි, දන්නා හඳුනන, අගය කරන පුද්ගලයන් පිළිබඳ තොරතුරු ඇසීමට වැඩි රුචිකත්වයක් දක්වති. එසේ වන්නේ ප්‍රවෘත්තිවල වටිනාකම කෙරෙහි බලපාන පහත කුමන සාධකය නිසාද?
(1) සමීප බව (2) බලපෑම හා වැදගත්කම (3) අදාළ බව (4) මානව ළැදියාව

21. මෙරට මුල් ම රූපවාහිනී ටෙලි නාට්‍ය වූ ' දිමුතු මුතු ' නිර්මාණය කළේ,
(1) දයාරත්න රටගෙදර මහතා ය. (2) එදිරිවීර සරත්චන්ද්‍ර මහතා ය.
(3) ඩී.බී. නිහාල් සිංහ මහතා ය. (4) නාලන් මෙන්ඩිස් මහතා ය.

22. රූපවාහිනී මාධ්‍යය නැරඹීමට වඩා ගුවන් විදුලි මාධ්‍ය ශ්‍රවණය කිරීමට දරුවන් යොමු කරන ලෙස මාධ්‍ය අධ්‍යයනය විෂයභාර ගුරුතුමා දෙමව්පියන්ට පැවසුවේ ය. එසේ කීමට වඩාත් බලපෑවේ,
   (1) ගුවන්විදුලිය පහසුවෙන් හැසිරවිය හැකි මාධ්‍යයක් වීමයි.
   (2) භූගෝලීය බාධක විරල වීමයි.
   (3) සංකීර්ණ අදහස් ලබා දීමට පහසු වීමයි.
   (4) පරිකල්පනීය මාධ්‍යයක් වීමයි.

23. ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල පුවත් පත හා ලියාපදිංචි කළ පළමු සිංහල පුවත් පත පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.
   (1) ලංකාලෝකය හා ලක්මිණි පහන (2) ලක්මිණි පහන හා ලංකාලෝකය
   (3) ලංකාලෝකය හා දිනමිණ (4) ඥානාර්ථ ප්‍රදීපය හා ලංකාලෝකය

24. රූප සංරචනයේ දී සිදු වන්නේ,
   (1) රූප රාමුවක් සැකසීමේ දී වැඩියෙන් අවධානය යොමු විය යුතු වස්තූන් මතුවන සේ පිහිටුවීමයි.
   (2) නිර්මාණාත්මක අපේක්ෂාවෙන් යුතුව රූප රාමුව තුළ ඇතුළත් වස්තූන් නිසි පරිදි සංවිධානය කිරීමයි.
   (3) ශිල්පියා දර්ශන දක්මෙන් දකින රූප රාමුව රූපගත කිරීමයි.
   (4) ඉහළ විභේදන බලයක් යටතේ ඡායාරූප ගැනීමයි.

25. ප්‍රබල දේශපාලන පක්ෂ දෙකක් අතර ඇති වූ ගැටුමක් පිළිබඳ තොරතුරු වාර්තාකරණයේ දී මාධ්‍යවේදියෙකු වඩාත් අවධානය යොමු කළ යුතු වන්නේ, ප්‍රවෘත්තියේ පහත සඳහන් කවර ගුණාංග කෙරෙහි ද?
   (1) නිවැරදි බව හා ක්ෂණික බව (2) පැහැදිලි බව හා ක්ෂණික බව
   (3) නිවැරදි බව හා සමතුලිත බව (4) නිර්මාණාත්මක බව හා නිවැරදි බව

26. ජනමාධ්‍ය තුළ දැන්වීම් අලෙවිය බහුලව සිදු වන්නේ,
   (1) ටෙලි නාට්‍ය විකාශන කාලයේ ය. (2) ළමා වැඩසටහන් විකාශන කාලයේ ය.
   (3) ප්‍රවෘත්ති විකාශන කාලයේ ය. (4) රියැලිටි වැඩසටහන් විකාශන කාලයේ ය.

27. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සම්මන්ත්‍රණයක දී දේශකතුමාට පෙළපොතේ ඇති ජොහැන්නස් ගුටෙන්බර්ග්ගේ ඡායාරූපයක් පෙන්වීමට අවශ්‍ය විය. ඒ සඳහා සුදුසු ප්‍රක්ෂේපණ යන්ත්‍රය වන්නේ,
   (1) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (2) අන්තර් ක්‍රියාකාරී පුවරුවයි.
   (3) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

28. මෙවර පොහෝ දිනයෙහි වන්දනා ගමනක් යෑමට සිතූ තාත්තා පවුලේ සියලු දෙනා කැඳවා ඒ පිළිබඳව දැනුවත් කරන ලදී. මෙම අවස්ථාව තුළ දක්නට ලැබෙන සන්නිවේදන වර්ග පිළිවලින් දක්වා අති පිළිතුර වන්නේ,
   (1) අන්තර් පුද්ගල සන්නිවේදනය හා සමූහ සන්නිවේදනයයි.
   (2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය හා සමූහ සන්නිවේදනයයි.
   (3) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය හා අන්තර් පුද්ගල සන්නිවේදනයයි.
   (4) අන්තර් පුද්ගල සන්නිවේදනය හා ජන සන්නිවේදනයයි.

29. තම යෙහෙළියක් වූ කුමාරි අසනීප වී ඇති බව නීතා කමලාටත්, කමලා රාණිටත්, රාණි නයනාටත්, නයනා විසින් රමණිට හා භාග්‍යාටත් පැවසුවාය. මෙම තොරතුරු ගලා යාම
   (1) අවිධිමත් සන්නිවේදනයේ තනි දාමයයි. (2) විධිමත් සන්නිවේදනයේ දාම ආකෘතියයි.
   (3) අවිධිමත් සන්නිවේදනයේ වයි ආකෘතියයි. (4) විධිමත් සන්නිවේදනයේ වයි ආකෘතියයි.

30. පුද්ගලයෙකුට තම පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගනිමින් අන් අයට හිරිහැරයක් නොවන අයුරින් ජීවත් වීමට ඇති අයිතිය තහවුරු කර ඇත්තේ,
   (1) පුරවැසිභාවය සංකල්පයෙනි. (2) මානව හිමිකම් හා වගකීම් වලිනි.
   (3) ප්‍රජාතන්ත්‍රවාදයෙනි. (4) පවුල නැමති සංකල්පයෙනි.

31. සමූහ ඡායාරූපයක් ගත් ඡායාරූප ශිල්පියා එම ඡායාරූපය අපහැදිලි බව පවසා මකා දමා නැවත ඡායරූපය කිහිපයක් ගත්තේය. එසේ කිරීමට හැකි වන්නේ,
   (1) අංකිත ඡායාරූපකරණයේ දී ය. (2) ශ්‍රමායික කැමරා ඡායාරූපකරණයේ දී ය.
   (3) සංවෘත පරිපථ රූපවාහිණී කැමරාකරණයේ දී ය. (4) රසායනික ඡායාරූපකරණයේ දී ය.

32. පුවත් පත් අන්තර්ගතය පිළිබඳව පළ වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.

P - සමස්ත කර්තෘ මණ්ඩලයම දරන මතය විදහා දක්වයි.

Q - තොරතුරු ප්‍රකාශ කිරීමට යොදා ගන්නා නිර්මාණශීලි ආකෘතියකි.

R - සංවාද, දෙබස්, කවි පන්ති, විචාරයන් ආදී ආකෘති ඇතුළත් ව ලියයි.

ඉහත ප්‍රකාශ සඳහා අදාළ වන ආකෘති පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) තීරු ලිපි, විශේෂාංග ලිපි, කතු වැකි (2) කතු වැකි, විශේෂාංග ලිපි, ප්‍රවෘත්ති

(3) කතු වැකි, කාටූන්, විශේෂාංග ලිපි (4) කතු වැකි, කාටූන්, ප්‍රවෘත්ති

33. රූපවාහිනි ප්‍රවෘත්ති සම්බන්ධයෙන් සිසුන් සිව් දෙනෙකු ඉදිපත් කළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. එයින් සදොස් ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රවෘත්තිය පිළිබඳව ඉදිරිපත් කරන රූප රාමු මගින් සිද්ධිය පිළිබඳව තොරතුරු සනාථ වෙනවා

(2) සෑම රූපවාහිනි නාලිකාවකම ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්නේ එකම ස්වරූපයකින්

(3) ආයතනයේ හිමිකම හා ප්‍රතිපත්ති අනුව තමයි ප්‍රවෘත්තිවලට ප්‍රමුඛතාවය දෙන්නේ

(4) බොහෝ ප්‍රවෘත්ති වැඩසටහන් සජීවී ආකාරයෙන් ඉදිරිපත් කරනවා

34. දැන් ඔයාට පුළුවන් ඔයා කැමතිම සෝන් එකකට රික්වෙස්ට් එකක් දාන්න' යැයි ගුවන්විදුලි නිවේදකයා ගීත ඉල්ලීම් වැඩ සටහනේ දී පැවසුවේ ය. මෙහිදී ඇති වන සන්නිවේදක බාධකය වන්නේ,

(1) යාන්ත්‍රික බාධකයි. (2) සංජානන බාධකයි. (3) කථන බාධකයි. (4) අර්ථ බාධකයි.

35. දුරකථනය භාවිතයේ දී පිළිපැදිය යුතු මුල් ම ආචාරධර්මය වන්නේ,

(1) කිව යුතු දේ කෙටියෙන් කීමයි. (2) තම අනන්‍යතාව හෙළි කිරීමයි.

(3) ආචාරශීලීව කථා කිරීමයි. (4) පෞද්ගලික ජීවිතයට බාධාවක් කර නොගැනීමය.

36. පහත දැක්වෙන්නේ මාධ්‍ය ආයතනයක් වෙත රජය කරන බලපෑම් කිහිපයකි

A - බදු පැනවීම. B - වාරණය කිරීම.

C - පරිගණක, නිවාස ලබා දීම. D - ආචාරධර්ම පැනවීම.

ඉහත කරුණු අතුරෙන් මාධ්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහි ඍජු මැදිහත් වීමක් දක්නට ලැබෙන්නේ

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) A හා D ය.

37. ශිෂ්‍ය නායක නිල ලාංඡන පැලැන්දීමේ උත්සවයෙන් පසු ඔවුන් සියලු දෙනාගේ සමූහ ඡායාරූපයක් ගැනීමට සූදානම් විය. ඒ සඳහා කැමරා ශිල්පියා භාවිතා කළ යුතු කාච වර්ගය වන්නේ,

(1) සාමාන්‍ය කාචයි. (2) දුර රූප කාචයි.

(3) පුළුල් කෝණ කාචයි. (4) පටු කෝණ කාචයි.

38. විද්‍යුත් පුවත්පතක වාසියක් නොවන්නේ,

(1) ක්ෂණිකව පුවත් දැන ගැනීමේ හැකියාවයි. (2) ක්ෂණිකව පාඨක ප්‍රතිචාර ලැබීමයි.

(3) නැවත නැවත කියවිය නොහැකි වීමයි. (4) ගබඩා කර තබා ගැනීමේ පහසුවයි.

39. ජීව දත්ත පත්‍රිකාවක් සැකසීමේ දී අනුගමනය නොකළ යුතු වන්නේ පහත සඳහන් කරුණුවලින් කුමක් ද?

(1) පරිගණක අකුරු භාවිතය (2) ආකර්ෂණීය බව

(3) මාතෘකා තද අකුරින් ලිවීම (4) වර්ණ අකුරු යොදා ගැනීම

40. පහත දැක්වෙන්නේ පරිගණක මුද්‍රණ යන්ත්‍ර කිහිපයක තොරතුරු වේ.

A - මුද්‍රණ යන්ත්‍රයට යොදා ඇති කුඩු භාවිතයෙන් මුද්‍රණය වන අතර කළු, සුදු, හා වර්ණ පිටපත් ලබා දෙයි.

B - තිත් වශයෙන් එක්වීමෙන් අකුරු මුද්‍රණය වන අතර සුන්දර නිමාවක් දක්නට නොමැත.

C - තීන්ත යොදා ගනිමින් සිදු කරන සුන්දර නිමාවකින් යුතු කළු සුදු හෝ වර්ණ පිටපත් ලබා දෙයි.

D - මුද්‍රණ යන්ත්‍රයට යොදා ඇති කුඩු භවිතයෙන් මුද්‍රණය වන අතර කළු හා සුදු වර්ණ පිටපත් පමණක් ලබා දෙයි.

ඉහත තොරතුරු අතුරින් බබල්ජෙට් මුද්‍රණ යන්ත්‍රයට අදාළ තොරතුරු ඇතුලත් පිළිතුර වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

වැදගත්:-

- **පළමු ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.**

---

(01) ජන මාධ්‍ය ගුරුවරයෙකුගේ භූමිකාව ඉටු කරමින් අධ්‍යාපන කාර්යයෙහි නිරත වෙයි.

(i) රූපවාහිනී මාධ්‍ය මගින් අධ්‍යාපන වැඩ සටහන් නැරඹීම කුමන සන්නිවේදන වර්ගයට අයත් වේද?

(ii) ගුවන් විදුලි මාධ්‍ය මගින් පාඩම් ඉගැන්වීමෙහි නිරත ගුරුභවතෙකුට වඩාත් වැදගත් වන සන්නිවේදන ස්වරූපය කුමක් ද?

(iii) රාජ්‍ය මාධ්‍ය ආයතන මගින් මෙන්ම පෞද්ගලික මාධ්‍ය ආයතන මගින් ද අධ්‍යාපන වැඩසටහන් විකාශනය කරයි. රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය ආයතනයක් හා පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය ආයතනයක් ලියන්න.

(iv) ගුවන් විදුලි අධ්‍යාපන වැඩ සටහන් ශ්‍රවණයේ දී සිසුන් ට අත් වන අවාසි 2 ක් ලියන්න.

(v) අධ්‍යාපන කාර්යයේදී පිටු පෙරලන ලැල්ල බහුලව භාවිත කෙරේ. පිටු පෙරළනයක් සැකසීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු 02 ක් ලියන්න.

(vi) අධ්‍යාපනික පුවත් පත් රාශියක් වෙළඳ පළේ දැකිය හැකිය. පුවත්පත් වර්ගීකරණය කළ හැකි ආකාර දෙකක් දක්වන්න.

(vii) කෙටි සිනමා පට හරහා ද අධ්‍යාපන කාර්යය සිදු කළ හැකිය. සිනමා මාධ්‍ය බිහි වීමට බලපෑ සිද්ධාන්තය කුමක් ද?

(viii) අධ්‍යාපනික තොරතුරු වින්දනාත්මකව ලබා දීමට යොදා ගත හැකි ගුවන් විදුලි වැඩසටහන් ආකෘති දෙකක් ලියන්න.

(ix) අ.පො.ස. (සා.පෙ.) විභාගය ඉලක්ක කර ගනිමින් රූපවාහිනි නාලිකාවක් මගින් ඉදිරිපත් කළ අධ්‍යාපන වැඩසටහනේ ප්‍රශ්න එකතු කර සඟරා කුඩා පොතක් සකස් කර ගන්නා ලදී. එම පොත බැඳීම සඳහා යොදා ගත හැකි බැඳුම් ක්‍රම දෙකක් දක්වන්න.

(x) විවිධ කතුවරුන් විසින් රචිත අධ්‍යාපනික ග්‍රන්ථ සඳහා ද ISBN අංකයක් ලබා දෙයි, ශ්‍රී ලංකාවේ මෙය ලබා දෙන්නේ කුමන ආයතනයක් මගින් ද? (ල. 2 x 10 = ල. 20)

02. සන්නිවේදන වර්ග හා ස්වරූප භාවිතයෙන් තොරව කෙනෙකුට සන්නිවේදනයේ යෙදිය නොහැකිය.

(1) කෙටි කතාවක් නිර්මාණයේ දී ඔබ සම්බන්ධ වී සිටින සන්නවේදන වර්ගය කුමක් ද? (ල. 01)

(2) දෙදෙනෙකු අතර සිදු වන සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(3) ඵලදායි ලේඛනයක් තුළින් හඳුනා ගත හැකි ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ල. 03)

(4) ජනමාධ්‍ය මගින් සමාජයට කරන බලපෑම කරුණු හතරක් යටතේ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 04)

03. මුද්‍රිත මාධ්‍ය තුළ ඡායාරූප බහුලව භාවිතා කරයි.

(1) ප්‍රාග් මුද්‍රිත මාධ්‍ය ස්වරූප දෙකක් නම් කරන්න. (ල. 01)

(2) ඡායාරූපකරණයේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම දෙකක් කෙටියෙන් දක්වන්න. (ල. 02)

(3) ප්‍රවෘත්ති ඡායාරූපයක් ගැනීමේ දී අවධානය යොමු කළයුතු කරුණු තුනක් විස්තර කරන්න. (ල. 03)

(4) වර්තමානයේ පුවත්පත්වල වර්ණවත් ඡායාරූප බහුලව යොදා ගනියි. ඡායාරූප නිසා මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි හතරක් විස්තර කරන්න. (ල. 04)

04. ප්‍රවෘත්ති යනු සුවිශේෂී වැඩසටහන් විශේෂයකි.

(1) තොරතුරු රැස් කිරීමේ ශිල්ප ක්‍රම දෙකක් නම් කරන්න. (ල. 01)

(2) ප්‍රවෘත්ති අන්තර්ගතය හා ස්වභාවය අනුව ඒවා ප්‍රභේද කළ හැකි ආකාර දෙක නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(3) තොරතුරු රැස් කිරීමේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම තුනක් විස්තර කරන්න. (ල. 03)

(4) පහත ගුණාංග, තොරතුරක මනා පිළිගැනීමට හේතුවන ආකාරය පැහැදිලි කරන්න.

(a) නිවැරදි බව (b) සමතුලිත බව

(c) පැහැදිලි බව (d) විශ්වාසනීය බව (ල. 04)

05. රූපවාහිනිය ප්‍රේක්ෂක ආකර්ෂණය දිනාගත් ගෘහස්ථ මාධ්‍යයකි.

(1) ලෝක රූපවාහිනි දිනය සමරනු ලබන්නේ කවදා ද? (ල. 01)

(2) රූපවාහිනි මාධ්‍ය තුළ නිශ්චල ඡායාරූප භාවිතා කරන අවස්ථා දෙකක් දක්වන්න. (ල. 02)

(3) රූපවාහිනි නාට්‍ය කලාවේ නව නාට්‍ය ප්‍රභේදය නම් කරන්න. එහි ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

(4) රූපවාහිනි මාධ්‍යයේ විශේෂතා හතරක් පැහැදිලි කරන්න. (ල. 04)

06. සිංහල ගුරුතුමා ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් ආධාරයෙන් 'හුණුවටය' නාට්‍ය නැරඹීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන ලදී.

(1) ඒ සඳහා භවිත කරන්නට ඇතැයි සිතිය හැකි ප්‍රක්ෂේපණ යන්ත්‍රය කුමක් ද? (ල. 01)

(2) නාට්‍යයේ නළු නිළියන් යොදා ගත් ගන්නා නිර්වාචික සන්නිවේදන අංග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(3) නිර්වාචික සන්නිවේදනය මෙන් ම වාචික සන්නිවේදනය ද නළු නිළියන් රඟ පෑමේ දී භාවිත කරන ලදී. වාචික සන්නිවේදනයේ දී භාෂාව සම්බන්ධයෙන් අවධානය යොමු විය යුතු කරුණු තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

(4) නාට්‍ය නැරඹීමේ දී ප්‍රේක්ෂකයා ප්‍රධාන වශයෙන් භාවිතයට ගත් සන්නිවේදන ස්වරූප දෙක නම් කර වෙන වෙනම විස්තර කරන්න. (ල. 04)

07. ජනමාධ්‍ය සංදේශවල සැබෑ අර්ථය හඳුනා ගැනීම සඳහා ජනමාධ්‍ය ආයතනවල ස්වභාවය හඳුනා ගැනීම අවශ්‍ය වේ.

(1) කර්තෘ හිමි පුවත්පත් දෙකක් නම් කරන්න. (ල. 01)

(2) පුවත්පතක උප කර්තෘගේ කාර්යයන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(3) ජනමාධ්‍ය ආයතන ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ යුතුකම් හා වගකීම් තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල.03)

(4) ගුවන්විදුලි මාධ්‍ය ආයතනයක දක්නට ලැබෙන පහත අංශ පිළිබඳ ව පැහැදිලි කරන්න.

A - පුවෘත්ති අංශය

B - දැන්වීම් අංශය (ල. 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(1) | 4 -(2) | 5 -(2) | 6 -(3) | 7 -(4) | 8 -(3) | 9 -(4) | 10 -(1) |
| 11-(4) | 12 -(1) | 13 -(1) | 14 -(1) | 15 -(2) | 16 -(3) | 17 -(2) | 18 -(4) | 19 -(2) | 20 -(1) |
| 21-(3) | 22 -(4) | 23 -(1) | 24 -(2) | 25 -(3) | 26 -(3) | 27 -(4) | 28 -(2) | 29 -(4) | 30 -(2) |
| 31-(1) | 32 -(3) | 33 -(2) | 34 -(4) | 35 -(2) | 36 -(1) | 37 -(3) | 38 -(3) | 39 -(4) | 40 -(3) |

(එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් හිමිවේ.)

## II පත්‍රය

01. (i) ජන සන්නිවේදනය
 (ii) වාචික සන්නිවේදනය
 (iii) රාජ්‍ය - ශ්‍රී ලංකා රූපවාහිනි සේවය / ස්වාධීන රූපාවාහිනී සේවය, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව / ලක්හඬ, පෞද්ගලික - දෙරණ / සිරස ආදී රූපවාහිනි හා ගු. වි. සේවා
 (iv) එක්වරක් පමණක් ඇසීම / සංකීර්ණ අදහස් තේරුම් ගැනීමට අපහසු වීම / ශබ්ද මාධ්‍යයක් පමණක් වීම / අවධානය ඉවතට යොමු වීමට ඇති ඉඩකඩ වැඩි වීම ආදිය.
 (v) නිර්මාණශීලි වීම / පන්තියේ සියලු සිසුන්ට ප්‍රදර්ශනය වන සේ අකුරු ලොකුවට ලිවීම / කෙටි වගන්ති හා සිත්තම් ඇතුළත් කිරීම ආදිය
 (vi) ප්‍රමාණය අනුව / පළවන වාරය අනුව / කේන්ද්‍රීය විෂය අනුව / භාවිත කරන පාඨකයා අනුව
 (vii) දෘෂ්ටි අඛණ්ඩතා සිද්ධාන්තය
 (viii) ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් / නාට්‍යමය වැඩ සටහන් / සංගීත වැඩ සටහන් ආදිය.
 (ix) කටු ගැසීම / දඟර බැඳීම / සිදුරු විද නූලකින් ගැට ගැසීම ආදිය
 (x) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් (ල. 2 x 10 = ල. 20)

02. (i) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය (ල. 01)
 (ii) සන්නිවේදකයාට ග්‍රාහකයා අවබෝධ කර ගැනීම පහසු වීම / සෘජු ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණය ලබා ගත හැකි වීම / පෙළඹවීම පහසු වීම / එකිනෙකා අතර වඩාත් ක්‍රියාකාරි අන්තර් සම්බන්ධතාවක් ඇති වීම ආදිය. (ල. 1 x 02 = ල. 02)
 (iii) නිරවුල් බව හා පැහැදිලි බව / ලේඛනයට උචිත ආකෘතිය / නිර්මාණශීලී බව / සම්මත ව්‍යාකරණ විධි භාවිතය (ල. 1 x 03 = ල. 03)
 (iv) දෛනික ජීවිතය වෙනස් කිරීම / පරිභෝජන රටාව වෙනස් කිරීම /විවිධ චිත්තාවේග වැඩි දියුණු කිරීම / රසවින්දනය වෙනස් කිරීම / විවිධ අපචාරී චර්යා කරා යොමු කිරීම / අන්‍යෝන්‍ය සම්බන්ධතා පළුදු කිරීම ආදිය (ල. 1 x 04 = ල. 04)

03. (i) ඇක්ටා ඩියුර්නා / ජපානයේ ඉයොමියුරි හෙවත් කවරබාන් මැටි පුවරු පුවත්පත / බ්‍රිතාන්‍යයේ අතින් ලියන පුවත් ලිපි / රුසියාවේ Courant නමින් අතින් ලියූ පුවත්පත් / ප්‍රවෘත්තිමය අවශ්‍යතා සඳහා භාවිත කළ මැටි හෝ ඉටි ගාන ලද ලෑලි (ල. 1/2 x 02 = ල. 01)
 (ii) වෙනත් ඡායාරූප ශිල්පියෙකුගේ නිර්මාණයක් අවසරයකින් තොරව භාවිතා නොකිරීම / අවසරයකින් තොරව අයකුගේ ඡායාරූප නොගැනීම හා ළඟ තබා නොගැනීම / අදාළ පුද්ගලයාගේ ඡායාරූප අවසරයකින් තොරව අන්තර්ජාලයේ හෝ වෙනත් මාධ්‍යයක පළ නොකිරීම හා හුවමාරු නොකිරීම / තාක්ෂණය යොදා ගනිමින් අන්‍යයන්ගේ ඡායාරූප විකෘති නොකිරීම / ඡායාරූප යොදා ගනිමින් අන්‍යයන් අපහසුතාවයට හෝ හිංසාවට ලක් නොකිරීම. වෙනත් අයකුගේ වැඩ කටයුතු වලට බාධා වන ලෙස ඡායාරූප නොගැනීම.
 (ල. 1 x 02 = ල. 02)
 (iii) අදාළ සියලු විස්තර ඇතුළත්ව තිබීම / අනවශ්‍ය දේ ඇතුළත් නොවීම / රාමුව තුළ ඡායාරූපික වස්තූන් මනාව සංවිධානය කර තබීම / උචිත කැමරා කෝණ භාවිත කිරීම / නිවැරදි ආලෝකය නිවැරදි අනාවරණය කිරීම ආදිය (ල. 1 x 03 = ල. 03)

**පිළිතුරු පත්‍රය - II කොටස - ඉතිරි කොටස**

(iv) පහසුවෙන් ග්‍රාහක ආකර්ෂණය දිනාගත හැකි වීම / අදහස් ප්‍රබලව ඉදිරිපත් කළ හැකි වීම / තාත්ත්වික බව නිසා ග්‍රාහක විශ්වාසය දිනාගත හැකි වීම / පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගත වීමට ඇති හැකියාව / ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට හැකිවීම (ල. 1 x 4 = 04)

04. (i) සම්මුඛ සාකච්ඡා / ප්‍රශ්නාවලි / නිරීක්ෂණ / ලේඛන පරිශීලනය / බුද්ධි කලම්භනය (ල. 1/2 x 2 = 01)

(ii) දෘඪ පුවත් / මෘදු පුවත් (ල. 1 x 2 = 02)

(iii) පෞද්ගලිකත්වයට හානි වන හෝ හෙළි කිරීමට අකමැති තොරතුරු ඉල්ලා නොසිටීම / ලබා දෙන තොරතුරුවල රහස්‍යතාවය ආරක්ෂා කිරීම / පෞද්ගලික වාසි අපේක්ෂාවෙන් තොරතුරු රැස් නොකිරීම / අදාළ තොරතුරු පමණක් විමසීම / පුද්ගලයෙකුගේ ජීවිතයට හානි වන තොරතුරු රැස් කිරීමෙන් වැලකීම ආදිය. (ල. 1 x 3 = 03)

(iv) නිවැරදි බව, සමතුලිත බව, පැහැදිලි බව, විශ්වාසනීය බව යන ගුණාංග තොරතුරක පිළිගැනීමට හේතුවන ආකාරය පැහැදිලි කර තිබිය යුතුයි. (ල. 1 x 4 = ල. 04)

05. (i) නොවැම්බර් 21 (ල. 01)

(ii) වෙළඳ ප්‍රචාරණ වලදී / රූපගත කිරීම් වලදී පාත්‍ර වර්ගයාගේ හා දර්ශන තලවල අංග රචනා කිරීමේ දී, වස්ත්‍රාභරණ ආදියේ අඛණ්ඩතාවය පවත්වා ගැනීම සඳහා / රූපවාහිනී මාධ්‍යයේ නියැලෙන ශිල්පීන්ගේ දත්ත හා තොරතුරු සම්පාදනයේ දී, ජනප්‍රියත්වය ගොඩනැංවීමේ දී හා පෞද්ගලික මතක සටහන් තබා ගැනීම සඳහා / සමරු ග්‍රන්ථ, විචාර ග්‍රන්ථ, සඟරා, සමරු කලාප සඳහා ය. (ල. 1 x 2 = ල. 02)

(iii) මෙගා නාට්‍ය (ල. 01)

- අඩු වියදමින් නිෂ්පාදනය කිරීම / කොටස් වැඩි ගණනකින් යුතු වීම / බෙහෝ විට පටිගත කිරීම අතර තුර විකාශනය කිරීම. (ල. 1 x 2 = ල. 02) (මුළු ලකුණු 03)

(iv) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වීම / සමීප මාධ්‍යයක් වීම / සජීවී මාධ්‍යයක් වීම / ජන මාධ්‍යයක් වීම / අස්ථායී මාධ්‍යයක් වීම / වියදම් අධික මාධ්‍යයක් වීම. ( ල. 1 x 4 = ල. 04)

06. (i) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය ( ල. 01)

(ii) අභිනය හා ඉරියව් / මුහුණේ පිළිබිඹුව / ඇස්වල හැසිරීම් / හඬ / ඇඳුම් ආදිය ( ල. 1 x 2 = ල. 02)

(iii) උච්චාරණය / අර්ථ ගැන්වීම / යෝග්‍යතාව යන අංග තුන විස්තර කළ යුතුයි. ( ල. 1 x 3 = ල. 03)

(iv) දෘශ්‍ය සන්නිවේදනය හා ශ්‍රව්‍ය සන්නිවේදනය (නම් කිරීමට ල. 1 x 2 = 2 විස්තර කිරීමට ල. 1 x 2 = 2 මුළු ලකුණු = 4)

07. (i) කවට කතිකයා / උදය තාරකෙ/ ඔබ්සවර් හා කොමර්ෂල් ඇඩ්වර්ටයිසර් / දිණමිණ (ල. 1/2 x 2 = 01)

(ii) පිටු සංස්කරණය කිරීම / ප්‍රවෘත්තියට මාතෘකා යෙදීම / පිටුවේ ඉඩකඩ හා වැදගත් කම අනුව පළවිය යුතු තැන තීරණය කිරීම ආදිය (ල. 1 x 2 = ල. 02)

(iii) රටක හිත සුව පිණිස අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ජනතාව වෙත ලබා දීම / රජයේ මැති ඇමරතිවරුන්ගේ, නිලධාරීන්ගේ වංචා දූෂණ අකාර්යක්ෂමතා ඇත්නම් ඒවා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම / මාධ්‍ය ආයතන පවත්වාගෙන යාමට අවශ්‍ය යටිතල පහසුකම් සපයා දීම / සියලු මාධ්‍ය ආයතන කැඳවා මාධ්‍ය සාකච්ඡා පවත්වමින් රජයේ වැඩ පිළිවෙලවල් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවස්ථාව සැලසීම ආදිය. (ල. 1 x 3 = ල. 03)

(iv) ප්‍රවෘත්ති අංශය හා දැන්වීම් අංශය පිළිබඳ විස්තර කළ යුතුය. (ල. 2 x 2 = ල. 04)